# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරුවල පුරප්පාඩු සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර**

**බාහිර අයදුම්කරුවන්**

**1. අධ්‍යක්ෂ - ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**1.1 සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධවිද්‍යාව/ සමාජවැඩ/ කළමනාකරණය/ වාණිජවේදී/ නීතිය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබාතිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථමඋපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**2. අධ්‍යක්ෂ - පර්යේෂණ - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**2.1 සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජවැඩ/සංඛ්‍යානය/රසායන විද්‍යාව/ තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබාතිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථමඋපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**3. අධ්‍යක්ෂ - මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු - පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**3.1 සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක්ලබා තිබීම.

සමඟ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබාතිබීම

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**4. අධ්‍යක්‍ෂ - ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා / පර්යේෂණ / මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු**

**4.1 සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සපුරා තිබීම අවශ්‍ය වේ.

4.1.අ. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

4.1ආ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍ය කළමනාකාර සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ අදාල තනතුරක සේවය කිරීම.

**වැටුප් කාණ්ඩය** - HM 1-1 – 2016

**වැටුප් පරිමාණය** - රු. 80,295/- 15 x 2,270/- රු. 114,345 (මාසිකව) කළමනාකාර සේවා චක්‍රලේඛ 02/2016 (1) ට අනුව වැටුප් පරිවර්තනය කර ඇත. 2019 වර්ෂයේ මූලික වැටුප රු. 71,942/- (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ඇතුලත්ය.)

**වයස** : අවු. 35 ට නොඅඩු හා අවු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය**

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කල යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**
බඳවාගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරඟ විභාගයක හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය**
ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

ඔබගේ තොරතුරු "A4" ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ: (www.nddcb.gov.lk) සඳහන් ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2019.07.17** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය** යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ/සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරින් තම අයදුම්පත් ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

**අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.**


**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර**
**රාජගිරිය.**

**දුරකථන : 2868794-6**
**ෆැක්ස් : 2868791--2**


ප්‍රකාශිත දිනය : 2019.06.26